

# මාතෘ දිව්‍ය පුත්‍රයාට අභිධර්මය දේශනා කිරීම පිළිබඳ මුසාව

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා හැරෙන්නට සියලුම බෞද්ධයන් හොඳින් දන්නා කරුණක් වනුයේ ප්‍රථම ධර්ම සංගායනාවෙදී සජ්ජායනා කරන ලද පිටක දෙකක් පමණක් වූ බවය. අභිධර්මය කියා පි-ටකයක් පවා පැවතියේද නැත. එහෙව් එකේ මාතෘ දෙව්පුතුන්ට දේශනා කිරීමට අභිධර්මයක් කොයින් සොයා ගත්තාද යන්න පිළිතුරු නොදිය හැකි ගැටළුවකි.

සිදුහත් කුමරුන් උපන් ගමන් සත් පියවරක් ගමන් කළ කතාව දේව වාක්‍යයක් ලෙසින් සළකන භික්ෂුන්වහන්සේලා මේ කතාවද ප්‍රතික්ෂේප කරනු ඇත . එහෙත් ලක්බිමට අහසින් වැඩම කිරීම සේම තව්තිසා ගමනත් බෞද්ධ පුරාණෝක්ති ගණයට ගැණෙන තවත් කතන්දරයක් පමණි.

බුදුන්ගේ නම විකුණා බිස්නස් කරන ගිහි - පැවිදි දෙපක්ෂයටම අහිතකර පුවතක් මම කියන්නෙමි. එය මගේම නිර්මාණයක් නොවන බව කල්තියාම කිව යුතුය. මට වඩා වයෝවෘද්ධ ඥානවෘද්ධ යයි කිව යුතු ශ්‍රී ලාංකික බුද්ධිමතකු - උසස් නිලදරුවකු - විසින් ලියා පළ කරන ලද අගනා ග්‍රන්ථයකින් උපුටා ගත් අදහස් අනුව මා කියන්නකි.

එම් චන්ද්‍රසෝම යනු දේශපාලකයන්ගේ අතකොලු බවට පත් නොවී රාජකාරි කිරීමට තරම් සවිමත් කොඳු නාරටියක් සහිත සිවිල් නිලධාරීන් අතර සිටි උගතෙකි. ඔහු වරාය අධිකාරියේ අධිපති වශයෙන් සේවය කළා මට මතකය. විශ්‍රාම ගැනීමෙන් පසු




ඔහු අවුරුදු හයක් හෝ හතක් පාලි විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කටයුතු වල නිරතව සිටියේ ය. එසේ කරන ලද පර්යේෂණ මගින් සොයා ගත් අගනා තොරතුරු ඇමරිකාවේ වසන සිය මුණුපුරා වෙත ලියන ලියුමක ආකාරයෙන් ලියා පසුව පොතක් වශයෙන් පළ කළේය. පොතේ නම ඉංගිරි-සියෙන් දක්වමි.

අද දවසේ සිතූ සිතූ විදියට ලොව පුරා සංචාරය කිරීමට සමත් මහ සඟරුවන එදා සිය ගුරුවරයා මධ්‍ය දේශය පුරා පයින් ඇවිද බණ දෙසූ බව පවා පිළිගනු ඇද්ද යන්න සැක සහිතය. මහා වෙනසක් ඇත . ඇමරිකාවේ සුදු මිනිසුන්ට බණ දෙසන්නට ගිහින් ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමාට උපදෙස් දීම වෙනුවෙන් ලක්ෂ එකහමාරක මාසික දීමනාවක් ලැබුණත් උන් වහන්සේ පඩියක් හෝ තෑගි බෝග බලාගෙන ගිය ගමනක් නැති බවය. ඒ ගිය සියළුම ගමන් පැහැදිලි අදහසක් අරමුණක් සහිතව ගිය බවද කිව යුතුය.

මිහිඳු හිමියන් සිරිලකට වැඩම කළේ නැව් මගින් බව මහාචාර්ය සුනිල්ආරියරත්න ලියූ “දෙමළ බෞද්ධයා” නම් පොතේ පැහැදිලිව පෙන්වා දී ඇත . ඒ වාගේම බුදු හිමියන්ද වැඩි බවක් කිව නොහැකිය. ආචාර්ය ඊ ඩබ් අදිකාරම් බඳු අදීන චින්තකයන් පමණක් නොබා පැවසූ මතයක් වූයේ බුදුන් කිසි දිනෙක සිරිලකට නොවැඩි බව ය. ඒ අනුව සිරි පතුලක් හෝ දිවා ගුහාවක් සොයා ගැනීමද බොරු වනු ඇත .

උප උපන් මව් බිමට සිදුව ඇත්තේ බුද්ධිමතුන් රහිත නැණ කතරක් බවට හෙමින් පරිවර්තනය වීමේ ආදීනව විඳගන්නටය. අද දවසේ අප විසින් පවා උගතුන් බුද්ධිමතුන් ප්‍රාඥයන් හැටියට සළකන ලද කාලෝ ෆොන්සේකා - ගුණදාස අමර-සේකර වැනි උදවිය පවා දේශපාලන කෝඩයට අහුවෙලාය. තමන්ගේ පාඩුවේ හෙම්හිට තම අනා-වරණ පාඨකයාට බෙදා දෙන සුනිල් ආරියරත්න වැනි තවත් අය සිටින්නටද ඉඩ ඇත . රටට අත්‍යවශ්‍ය වනුයේ සුචරිත ගම්ලත් ගේ සවිය සහිත බුද්ධිමතුන්ය. උගතුන්ය.

එබන්දකු සිටියා නම් යටත් පිරිසෙයින් බෞද්ධ පර්යේෂකයන් ලෙසින් කටයුතු කරන භික්ෂූන් වත් සිතට ගත්තා නම් - චන්ද්‍රසෝම අනාවරණය කරන කරුණු ඒ පොත් මගින්ම සොයා ගන්නට සමත්වනු නිසැකය.

ඒ ටික බැරි නම් ලියුවාට පසුව හෝ මේ මනුස්සයා අප ළඟම සිට මොනවා හාරා ඇවිස්සුවාද කියා බලන්නට වත් ඔහු පළ කළ පොත කියවන්නට කිබුණා නොවේද?

මට අදහා ගත නොහැකි පුදුමය එයත් නොවේ. මා කියන කතුවරයාගේ සොහොයුරිය වන මහාචාර්ය ලෝනා ප්‍රනාන්දු පවා මෙහි අනාවරණය කරනු ලබන අගනා අදහස් පාඨකයා හමුවේ තැබීමට නොසිතීමය. ඇය සිතා මතාම නිහඬව සිටියාද?

හිස රුදාවට කොට්ට මාරු කරන තරමට රජය මාරු කිරීමට පුරුදුව සිටින රටක සාහිත්‍යය ආගම බඳු නීරස විෂය ගැන සිතීමට කාලය මිඩංගු කරන අය නැත . ආගම ගැන කතා කළ යුතු නම් ඒකටම වෙන් කරන ලද අමාත්‍යාංශයක් ඇත . ඒ උදවිය ඒ කටයුතු බලා ගන්නවා ඇත . ආගම වෙළදාම් කරන අය මල් වට්ටියක් අරන් මාලිගාවට හරි පිරිකරක් අරන් මල්වත්තට හරි යන එක විතරය. මහනුවර මල් කඩ සිවුරු කඩ ඉතිරි හරියට වග කියනු ඇත .

දෙවියන් වඳින අයට නොමිලේ තිරුපති කෝවිලට යාමට ගමන් පහසුව සළසනු ලැබේ. පරණ ජනපතිලා සිය ගණනක් පිරිස කැටුව ගිය බව අපි දනිමු. දැන් ගණන අඩු වුණත් ගමන ඇනහිට නැත. බිස්නස් එකට දෙවියන් ගාවා නොගත්තොත් උන්නැහේද අමනාප වනු ඇත .

තවත් ටිකක් කීමට කලින් මෙහෙම ඇවිස්සීම සුදුසු යයි මට සිතුනේය. දැන් ඉතිරි හරියෙන් තවත් බිඳක් කියමි.

සිදුහත් කුමරුන්ගේ සමකාලිකයකු වූ පර්සියානු අදිරදවරයා මහා පෙදෙසක අධිපතියා බවට පත් වූයේ මහා ඩේරියස් අධිරාජයා නමින් ය. ඔහු සමග සමීප සබඳතාවක් පැවැත් වූ රජ පවුලක් උතුරු ඉන්දියාවේ ශාක්‍ය වංශයට අයත් විය. සිදුහත් පමණක් නොව ඔහුගේ පියා සුද්දෝදන රජු පවා පර්සිපොලිස් රජ මාලිගාවට ආ ගිය හිතවතුන් බව කියනු ලැබේ.

දේවාරෝපණය පිළිබඳ මිථ්‍යාව නිර්මාණය වූයේ එබඳු පුවතක් ඇසුරෙන් බව අප ඉදිරියට ආ ලේඛකයා විස්තර කරන පුවතෙන් හෙළි වෙයි. ඒ පොතේ කොටසක් උපුටා දක්වමි.

“තමාගේ ආසනය දැරිය නොහැකි තරමට රත් වූ විගස ලොව දෙස නෙත් යොමු කරන සක් දෙව් රජ රජ හිණිමගක් ඔස්සේ මහ පොළොවට පහත් වූ බවක් කියැවෙයි. ඩේරියන් රජුගේ රාජ සභාව පිහිටියේ මාලිගාවේ සත්වන මහලේය. එහි සිට පහතට බැසීම සඳහා වූයේද හිණිමගකි. ශාක්‍ය ප්‍රවාදයට මුල් වූ සාධකය එයින් අනාවරණය වන්නේය”

අවශ්‍ය වුවහොත් නැවත හමුවෙමු.




## හොරණ

### ඉඩමක් හා නිවස විකිණීමට

**හොරණ නගරයට ආසන්න**
**සියළු පහසුකම් සහිත**
**පර්චස් 20ක ඉඩමක් හා නිවස**
**විකිණීමට තිබේ.**
**විස්තර සඳහා අමතන්න 0411 421 227**